

සිදුහත් කුමරු ගිහිගෙය අතහැර යෑමට සූදානම්ව...

### ჯ ජලයේ පවිත්‍රතාව රැකීමට බුදු හිමියෝ ශික්ෂා පද පනවති

– ආචාර්ය බෙලිගල්ලේ ධම්මජෝති
ජල සම්පත පරිහරණය පිළිබඳ බුදුරදුන් භික්ෂූන් වහන්සේට සහ ගිහියන්ට ලබා දුන් උපදෙස්. සොබා දහම පිළිබඳ උනන්දුවක් දැක්වූ බුදු හිමියන් ජල සම්පතෙහි වටිනාකම පිළිබඳ දේශනා කර ඇති අදහස්.

### ჯ බුදුන් වහන්සේ අනුදැන වදාළ සාමයික සහජීවනය

– ගලගම ධම්මරංසි හිමි
බුදුරදුන් – තමන් අවබෝධ කර ගත් දහම සමාජයට දේශනා කිරීමේ දී දැක්වූ සහනශීලී ආකල්පය විග්‍රහ කැරෙන මෙම ලිපියෙන් අනෙකුත් මතවාද දරන අය හා අනෙකුත් ආගම් ශාස්තෘවරුන් සහ ඔවුන්ගේ ආකල්ප විෂයෙහි බෞද්ධයා දැක්විය යුතු ප්‍රතිචාරය පිළි–බඳ සම්බුදු ඔවදන් විමසුමට ලක් කැරේ.

### ჯ සදහම් දැනුම

– වහුමුවේ විජයවංස නා හිමි
බුදු දහම හා ඒ ආශ්‍රිත විවිධ විෂය කරුණු පිළිබඳ – කෙටි ප්‍රශ්න හා පිළිතුරු මගින් පාඨකයා දැනුවත් කරන විශේෂාංගයකි. දහම හදාරන සිසුන්ට මෙම විශේෂාංගය විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකිය.

### ჯ බ්‍රහ්මාති මාතා පිතරො

– ගංගොඩවිල සෝම හිමි
මවුපිය ගුණ මහිම සහ මවුපියන් සහ දරුවන් අතර ඉටු විය යුතු යුතුකම් පිළිබඳ විමර්ශනයක් ලෙස හැඳින්විය හැකි මෙම ලිපිය ශ්‍රී ලංකාවේ බෞද්ධ ජනතාව අතර ප්‍රකට ධර්ම කථික හිමිනමක් ලෙස වැඩ සිට මෑතක දී අපවත් වී වදාළ වියත් හිමි නමක විසින් රචනා කරන ලද්දකි.

### ჯ මහ රහතුන් වැඩ සිටි සාංචි පින් බිම

– සිරිසමන් විජේතුංග
භාරතයේ මධ්‍ය දේශයේ පිහිටි සාංචි ස්ථූපය මුල් කොට ගත් සාංචි පුද බිම පිළිබඳ ඓතිහාසික හා වර්තමාන තොරතුරු විමසුමට ලක් කැරෙන මෙම ලිපිය – ‘බෞද්ධ භාරතය’ විශේෂාංගයේ පස් වැනි කොටස යි.

### ჯ මහමෙව්නාව අසපුව

– ජනක වෙත්තසිංහ
“සිත් සනහන සෙනසුන” විශේෂාංගය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දෙම්පෙ මැතිවරණ කොට්ඨාසයට අයත් පාළුගම ප්‍රදේශයේ සුන්–දර පරිසරයක පිහිටි ආරණ්‍ය සේනාසනයක් පිළිබඳ තොරතුරු.

### ჯ දම් අමා රස

– නුගවෙල ප්‍රඥජෝති නාහිමි
“ධම්මපදය” නම් වූ සුප්‍රකට – ඉපැරණි බෞද්ධ ග්‍රන්ථයේ සඳහන් වන; ගිහි – පැවිදි කාටත් එකසේ මග පෙන්වන වැදගත් ගාථා පාඨවල අර්ථ – පද්‍යයෙන් පැහැදිලි කැරෙන විශේෂාංගයක දෙවැනි කොටස.

### ჯ සතර සතිපට්ඨාන භාවනා විධි

– මහාචාර්ය උතුරාවල ධම්මරතන හිමි
නිවන් සැපත ලබා ගැනීම සඳහා වූ විදර්ශනා භාවනා විධියක් ලෙස සැලකෙන සතර සතිපට්ඨාන භාවනාව වඩන ක්‍රමය පිළිබඳ පාඨ–කයා දැනුවත් කිරීම සඳහා ලියැවුණු ලිපි පෙළක තුන් වැනි කොටස.

### ჯ බුදු මග සීල සංවිධානයෙන්....

–සේයාරු විමල් කරුණාතිලක

## ⌘ සිඟාලෝවාද සූත්‍රයෙන් විස්තර වන බෞද්ධ ආචාර ධර්ම

– ගම්පොළ ඤාණසීහ හිමි
බෞද්ධ ගිහි විනය පිළිබඳ සුප්‍රකට සිඟාලෝවාද සූත්‍රය නම් වූ බුද්ධ දේශනාවේ ඇතුළත් සමාජ ආචාර ධර්මවල වටිනාකම පිළිබඳ විමසුමක් වන මෙය – "සූත්‍ර ධර්ම" විශේෂාංගය යටතේ පළවන ලිපියකි.

## ⌘ Mara - The evil one

*-by Aryadasa Ratnasinghe*

## ⌘ බෞද්ධ නායක චරිත ඝාතනයට මිලියන ගණන් "දෙයියෝ සාක්කි"